චක්‍රලේඛ අංකය : 04 / 2024

WPCEC/MA 01/චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප)
අංක 628, ජනජය සිටි ගොඩනැගිල්
8 වන මහල, නාවල පාර
රාජගිරිය
2024.01.31

බස්නාහිර පළාතේ
සියළුම වි.සේ.ස සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති,
සභාපතිවරුන් වෙත.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( කෘෂි ) – 102 : 04 ශ්‍රේණියේ තනතුර**

බස්නාහිර පළාතේ සමුපකාර සමිති වල පවත්නා අවශ්‍යතාවය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කෘෂි) තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් පහත පරිදි අනුමත කරනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුරේ නම | : | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( කෘෂි ) |
| වැටුප් පරිමාන අංකය | : | 102 : 04 |
| බඳවා ගැනීමේ සේවා මට්ටම | : | කළමනාකරණ |
| අවම වයස් සීමාව | : | අවුරුදු 26 |
| උපරිම වයස් සීමාව | : | අවුරුදු 45 |

තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

අ. 102.04 වැටුප් පරිමානයේ අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 02 කට හෝ 102.5 වැටුප් පරිමානයේ ස්ථිර තනතුරක වසර 03 කට හෝ 102.06 වැටුප් පරිමානයේ අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 05 කට හෝ නො අඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ. තනතුරේ ක්ෂේත්‍රයට අදාල වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාවක් හෝ රජය පිලිගත් ආයතනයක කෘෂිකර්මය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සමඟ 102.06 වැටුප් පරිමානයේ අදාල ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පලපුරුද්දක් ලබා තිබීම

හෝ

ඇ. රජය පිලිගත් ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාවක් සමඟ රජය පිලිගත් ආයතනයක ක්ෂේත්‍රයට අදාල කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඇ.පිලිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ පිලිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත.

පිටපත් :1. ලේකම්, පළාත් මාර්ග , ප්‍රවාහන සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප) - කා.දැ.ගැ.පි
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප) - කා.දැ.ගැ.පි